දිනමිණ The Dinamina epaper

# රැකියා ඇබෑර්තු

## අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය
## (බස්නාහිර පළාත)

## සහකාර අධ්‍යක්ෂ (නීති) -ස්ථිර

තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**වැටුප් පරිමාණය** : රු.53,175-10 x 1,375-15 x 1,910-95,575- MM 1-1 හා රජයේ අනුමත දීමනා

**අධ්‍යාපන සුදුසුකම්** : පිළිගත් විශ්ව විද්‍යාලයක LLB උපාධියක් සමග

**පළපුරුද්ද** : නීතිඥවරයෙකු ලෙස වසර දෙකක(02) පළපුරුද්ද

**වෙනත් කරුණු :**

1. මෙය ස්ථිර පත්වීමකි. අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ.
2. බඳවාගනු ලබන අයදුම්කරුවන්ගේ මූලික වැටුපෙන් 10% ක් සේවක අර්ථ සාධක අරමුදල සඳහා ඔවුන් විසින් ගෙවිය යුතු අතර (15% ක සේවක අර්ථ සාධක අරමුදල සඳහා ද 3% ක් සේවා නියුක්ත භාර අරමුදල සඳහා ද ) අධිකාරිය විසින් දරනු ලබයි.
3. බඳවා ගන්නා අයදුම්කරුවන් ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් මූල්‍ය රෙගුලාසි, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග, ශ්‍රී ලංකා රජය විසින් හෝ බස්නාහිර පළාත් සභාව විසින් පනවා ඇති හෝ විටින් විට පනවනු ලබන නියෝග හා රෙගුලාසි වලට අවනත විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය:**

අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සභාපති විසින් කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂන මණ්ඩලයක් ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, නිසි පරිදි සම්පූර්ණ නොකළ අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත ලැබුණු බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ.

**ඉල්ලුම් කළ යුතු පිළිවෙල:**

සිය විස්තර ඇතුළත් කරමින් ඔබ විසින් සකස් කරන ලද අයදුම් පත්‍ර 2024/01/01 වන දිනට හෝ ඊට පෙර, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බ.ප.), තුම්බෝවිල, කරදියාන, පිළියන්දල යන ලිපිනයට ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.

සම්මුඛ පරීක්ෂන සඳහා සහභාගීවීම වෙනුවෙන් කිසිදු දීමනාවක් ගෙවීමට කටයුතු කරනු නොලැබෙන අතර කිසිදු අයුරකින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල තීරණයට බලපෑම් කිරීම එම තනතුර ලැබීමට නුසුදුසුකමක් සේ සලකනු ලැබේ.

බස්නාහිර පළාත තුළ පදිංචි අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**සභාපති,**
**අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බ.ප.),**
**2023.12. 15 දින**